**මධ්‍යම පළාත් කලා උළෙල - 2024**
**<u>සාහිත්‍ය නිර්මාණ තරගාවලිය</u>**

**විවෘත අංශය**

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන මධ්‍යම පළාත් කලා උළෙල විවිධාංග රැසක් සමගින් 2021 ඔක්තෝම්බර් මාසයේදී පැවැත්වීමට තීරණය කර ඇත.

එම කලා උළෙල නිමිති කොට ගෙන මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි සාහිත්‍ය නිර්මාණකරණයේ යෙදෙන අය වෙනුවෙන් පහත සඳහන් අංශයන්ගෙන් විවෘත සාහිත්‍ය නිර්මාණ තරගාවලියක් පැවැත්වීමට අවස්ථා සලසා ඇත. එම තරග 2024-06-15 වන දිනට පෙර පවත්වා නිම කළ යුතුව ඇති බැවින් නිර්මාණ යොමු කිරීමේදී, අයදුම්පත්‍රය සමඟ එක් නිර්මාණ අංශයකින් එක් නිර්මාණයක් පමණක් පිටපත් එකකින් පහත ලිපිනයට යොමු කළ යුතු වේ. ලිපි කවරයේ වම්පස ඉහළ **"මධ්‍යම පළාත් කලා උළෙල 2024"** ලෙස සඳහන් කළ යුතු වන අතර සියලුම නිර්මාණ **පළාත් අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර** යන ලිපිනයට එවිය යුතු බව කාරුණිකව දන්වා සිටිමි..

**තරගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්ගේ අවධානයට**

1. විවෘත තරග සඳහා වයස් සීමාවක් නොමැති අතර මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අය සඳහා ඉදිරිපත් විය හැකිය. නමුත් එක් තරගයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි. එසේම එක් තරගකරුවෙකුට ඉදිරිපත් විය හැක්කේ උපරිම තරග ඉසව් 02 කට පමණි. (එවනු ලබන නිර්මාණ පිටපත් කිසිවක් ආපසු ලබා දෙනු නොලැබේ).

2. නිර්මාණ ඉදිරිපත් කිරීමේදී කිසියම් පුද්ගලයෙකු ජාතියක්., ආගමක් හෝ දේශපාලන පක්ෂයක් විවේචනය නොවන අයුරින් ඉදිරිපත් කිරීමට වග බලා ගත යුතුය.

3. නිර්මාණ ඉදිරිපත් කිරීමේදී අයදුම්කරුගේ තොරතුරු අයදුම්පතේ පමණක් සඳහන් කළ යුතු අතර නිර්මාණයේ කිසිවක් සඳහන් කළ යුතු නොවේ. නිර්මාණකරුගේ තොරතුරු සඳහන් කර ඉදිරිපත් කරන නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. නිර්මාණ ගොනු කිරීමේ පහසුව සඳහා ඔබ ඉදිරිපත් කරන කඩදාසියේ වම් පසින් අඟලක ප්‍රමාණයක තීරුවක් ඉතිරි කළ යුතුයි.

5. ඉදිරිපත් කරනු ලබන නිර්මාණ ස්වතන්ත්‍ර නිර්මාණයක් බවට සහතික කොට ඉදිරිපත් කළ යුතු වේ. එම නිර්මාණය කිසියම් ආකාරයකින් ස්වතන්ත්‍ර නිර්මාණයක් නොවන බවට ඔප්පු වුවහොත් ජයග්‍රහණය අවලංගු කිරීමට සිදුවන බවත් යම් හෙයකින් එම නිර්මාණ අයිතිය ප්‍රකාශ කරමින් නීතිමය වශයෙන් හෝ වෙනත් කුමන ආකාරයකින් යමෙකු ඉදිරිපත් වුවහොත් පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් හා විනිශ්චය මණ්ඩලය එම වගකීමෙන් නිදහස් වන බවත් අවධාරණය කෙරේ.

6. ජයග්‍රාහී තරගකරුවන් 2024 ඔක්තොම්බර් මස පැවැත්වීමට නියමිත කලා උළෙලේදී සහතිකපත් සහ ත්‍යාග පිරිනමමින් ඇගයීමට ලක් කෙරේ. එතෙක් තරග ප්‍රතිඵල නිකුත් කරනු නොලබන බව සලකන්න.

7. නිර්මාණ ලබා ගන්නා අවසාන දිනය 2024-06-15 වන අතර තරග පැවත්වීම සම්බන්ධව අවසන් තීරණ පළාත් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් ගනු ඇත.

**ජයග්‍රාහකයින් ඇගයීම  පහත සඳහන් පරිදි වේ. :-**

| අනු අංකය | තරග අංශය | ස්ථානය |
|---|---|---|
| 01. | නව කතා අත් පිටපත් තරගය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය<br>4. කුසලතා ස්ථාන-02 |
| 02. | කෙටි කතා අත් පිටපත් තරගය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය<br>4. කුසලතා ස්ථාන-02 |
| 03. | ළමා කතා අත්පිටපත් තරගය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය<br>4. කුසලතා ස්ථාන-02 |
| 04. | සුභාවිත ගීත රසාස්වාදන තරගය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය |
| 05 | පද්‍ය රචනා තරගය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය |

**<u>තරග කොන්දේසි</u>**

**1. නව කථා අත් පිටපත් තරගය**

i අත් පිටපත් මුද්‍රිත පිටු A4 ප්‍රමාණයේ කඩදාසි තනි පැත්තේ පිටු 100-200 අතර ප්‍රමාණයක් වේ. යැයි අපේක්ෂා කෙරේ. අත් අකුරින් ලියා ඉදිරිපත් කරන්නේනම් A4 ප්‍රමාණයේ කඩදාසි තනි පැත්තේ පිටු 350 - 400 පමණ විය යුතුය.

ii මෙතෙක් පළවී ඇති වෙනත්  කෘතියක පරිවර්තනයක් හෝ අනුවර්තනයක් නොවිය යුතු අතර එය ස්වකීය නිර්මාණයක් බවට ලේඛකයා  විසින් සහතික කළ යුතුය.

**2. කෙටි කථා තරගය**

ලේඛකයා කැමති තේමාවක් යටතේ තනි පැත්තේ පරිගණක ගත කළ A4 ප්‍රමාණයේ කඩදාසි 8 කට නොවැඩි විය යුතුය. අත් අකුරින් ලියා ඉදිරිපත් කරන්නේ නම් තනි පිටුවේ පැහැදිලි අකුරින් ලියන A4 ප්‍රමාණයේ පිටු 15 ක් නොඉක්ම විය යුතුය.

**3. ළමා කථා අත් පිටපත් තරගය**

**i.** අත්පිටපත් මුද්‍රිත පිටු 16 - 30 ත් අතර ප්‍රමාණවත්ය

**ii .** ළමා මනසට යෝග්‍ය වර්ණ භාවිතයෙන් කතාවට ගැලපෙන චිත්‍ර ඇතුලත් කළ හැකිය.

**iii.** මෙතෙක් පළවී ඇති ළමා කථාවක පරිවර්තනයක් හෝ අනුවර්තනයක් නොවිය යුතු අතර එය ස්වකීය නිර්මාණයක් බවට ලේඛකයා විසින් සහතික කළ යුතුය.

**4. සුභාවිත ගීත රසාස්වාදන විචාරය පිළිබඳ තරගය (විවෘත අංශය)**

මහාචාර්ය සුනිල් ආරියරත්නයන් පද රචනය කළ විශාරද නන්දා මාලිනී ගායනා කරන

**" වහින්නට හැකිනම් ගිගුම් දී - වියළි ගම්බිම් වලට ඉහළින්**

**ඉදෙන්නට හැකි නම් බතක් වී - බතක් නොයිදෙන පැලක රහසින් .........."** ගීතය විචාරය කළ යුතුය. ඔබගේ විචාරය තනි පැත්තේ පරිගණක ගත කළ A4 ප්‍රමාණයෙ පිටු 08කට නොවැඩි විය යුතුය. අත් අකුරින් ලියා ඉදිරිපත් කරන්නේනම් තනි පිටුවේ පැහැදිලි අකුරින් ලියන A4 ප්‍රමාණයේ පිටු 15 ක් නොඉක්මවිය යුතුය.

**5. පද්‍ය රචනා තරගය (විවෘත අංශය)**

**i.** සදැස් කවි නම් පද්‍ය 8 කට සීමා විය යුතුය

**ii .** නිසඳැස් පද්‍ය/නිදහස් පද්‍ය/ නම් එම කවිපෙළ එක් පිටුවකට සීමා විය යුතුය.

නිර්මාණ ඉදිරිපත් කිරීමේදී සෑම නිර්මාණයක් සඳහාම සහතික කරන ලද අයදුම්පත්‍රය සමග නිර්මාණයේ එක් පිටපතක් පමණක් අයදුම්පත්‍රය සමග අදාළ දිනට පෙර **පළාත් අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර** යන ලිපිනයට 2024 -06 -15 දිනට පෙර තැපැල මගින් එවිය හැකි අතර අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංස්කෘතික නිලධාරි වෙත භාර දීම හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත අතින් ගෙනවිත් භාර දීමට හැකිය. තවද මෙම තරග පිළිබඳ තොරතුරු www.culture.cp.gov.lk යන මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් ද ලබාගත හැකි බව කාරුණිකව සළකන්න.

විමසීම් : 081-2238476

ටී.එම්. ඉනෝදනී තඹවිට
පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
මහනුවර

**මධ්‍යම පළාත් කලා උළෙල - 2024**
**විවෘත අංශයේ සාහිත්‍ය නිර්මාණ තරග සඳහා ආදර්ශ අයදුම්පත්‍රය**

(1). සම්පූර්ණ නම : - ..............................................................................

.............................................................................. හිමි/ මයා/ මිය/මෙනවිය

(2). මුලකුරු සමඟ නම :- ..............................................................................

..............................................................................

(3). පෞද්ගලික ලිපිනය :.- ..............................................................................

..............................................................................

(4) Email ලිපිනය :- ..............................................................................

(5). ස්ථාවර දුරකථන අංකය :- .............................................. ජංගම දුරකථන අංකය :-..............................

( 6). ස්ත්‍රී පුරුෂ භාවය :- ..............................................................................

( 7). උපන් දිනය :-. ..............................................................................

( 8). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ..............................................................................

( 9). දිස්ත්‍රික්කය : ..............................................................................

(10). නිර්මාණය ඉදිරිපත් කරනු ලබන අංශය :- ..............................................................................

(11) ඉදිරිපත් කරන නිර්මාණයේ නම :- ..............................................................................

අයදුම්කරුගේ ප්‍රකාශය:

ඉහත නම් සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ඉදිරිපත් කරන නිර්මාණය මගේ නිර්මාණයක් බව සහතික කරන අතර තරගයේ සියලුම කොන්දේසිවලට හා නීති-රීතිවලට එකඟව කටයුතු කරන බවත් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගන්නා බවත් මෙයින් සහතික කරමි.

(සැ. යු. නිර්මාණ ඉදිරිපත් කිරිමේදී අයදුම්පත්‍රයේ නම සමඟ මහතා මහත්මිය මෙනවිය යන්න ඉතා පැහැදිලි අකුරින් ලිවිය යුතුය.)

.............................................. ..............................................

දිනය අයදුම්කරුගේ අත්සන

සංස්කෘතික නිලධාරිගේ නිර්දේශය:-

මධ්‍යම පළාතේ.............................................. දිස්ත්‍රික්කයේ .............................................. .ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ..............................................ග්‍රාම නිලධාරි වසමේ ස්ථිර/තාවකාලික පදිංචි කරුවෙකු බවට සහතික කරමි.

.............................................. ..............................................

දිනය සංස්කෘතික නිලධාරිගේ අත්සන
නිල මුද්‍රාව